සිනුවර හරහා හමා ගිය "මතක සුළඟ"

ආචාර්ය මහේෂ් බණ්ඩාරයන් විසින් අධ්‍යක්ෂණය කරනු ලැබූ, "මතක සුළඟ" ටෙලි නාට්‍යයේ විශේෂ දර්ශනයක් පෙබරවාරි 12 වන දින සිඩ්නි නුවර රිඩින්ග් සිනමා සංකීර්ණයේ දෙවන ශාලාවේදී ප්‍රදර්ශණය විය. එය නැරඹීමට පැමිණි ප්‍රේක්ෂකය-න්ගෙන් එම ශාලාව සම්පූර්ණ ලෙස පිරී ගිය අතර, ඉතා දුලබ අත්දැකීමක් වින්දනය කිරීමට ඒ සැමටම මහඟු අවස්ථාවක් ලැබුණි. පැය 8 කට පෙළ ගස්වා තිබූ "මතක සුළඟ" ටෙලි වෘතාන්තයෙහි මුල් පිටපත, පැය 3 කට සංක්ෂිප්ත වන සේ නැවත සංස්කරණය කිරීමෙන් එම විශේෂ දර්ශනය නිර්මිත වී තිබිණ. ප්‍රේක්ෂක රසාස්වාදයට කිසිදු හානියක් සිදු නොවනසේ, සුමුදු ලෙස කතාව ගලා යාමට ඉඩ හසර සලසා ලමින් ඉතා දක්ෂ ලෙස එම සංස්කරණය සිදුකර තිබීම ද, සුවිශේෂී වේ.

තවද සම නිෂ්පාදකවරයෙකුව සිට, මෑතකදී වියෝවූ ජයසිරි ලියනපතිරණ මහතාට උපහාරයක් ලෙස එම දර්ශනය නම් කර තිබිණ.
ඉතා දක්ෂ ලෙස හා සංකීර්ණ ලෙස ප්‍රබන්ධ කර, තිර රචනය කරන ලද මෙම වෘතාන්තයෙන් කිය-වෙන්නේ පිය සෙනෙහස සොයා යන පූතෙකු වටා ගෙතුණු අනුවේදිණය කතා පුවතකි. අබොරිජින් ජාතික මවකට හා සිංහල පියෙකුට දාව උපත් මහින්ද, තරුණ විටට පත්ව විශ්ව විද්‍යාල අධ්‍යාපනයට පිවිසෙයි. ඔහු තමා හා එකට අධ්‍යයන කටයුතුවල නියැලෙන සිංහල මිතුර මිතුරියන් කිහිප දෙනෙකුගේ සහායෙන්, තම පියා සෙවීමට උත්සාහ දරයි. ප්‍රේක්ෂක සිත් සතන් ඇද බැඳ තබා ගැනීමට සමත් ලෙස ඉතා සාර්ථක අන්දමින් මෙම කතා පුවත පෙළ ගැස්වීමට තිර රචනය, අධ්‍යක්ෂණය මෙන්ම රංගනයෙන් ද කරඇති පෙළහර ඉතා ප්‍රශංසනීය වේ.

දැනට ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශණය වන බොහෝමයක්ම ටෙලි නාට්‍යවලට වඩා "මතක සුළඟ" ඇත්තේ ඉතා ඉදිරියෙනි. එය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හොඳම ශ්‍රේණියේ ටෙලිනාට්‍යයක් ලෙස වර්ගීකරණයට ලක්ව, හොඳම කාල පරාසයේ ප්‍රදර්ශණයට නිර්දේශිතව ඇත.

ආචාර්ය මහේෂ් බණ්ඩාරයන් අධ්‍යක්ෂණය කරන ලද මෙම කුළුඳුල් නිර්මාණයෙන්ම ටෙලි නාට්‍යය නිර්මාණකරණයේ ලා ඔහු සතු ශිල්පීය හැකියාවන්

අධ්‍යක්ෂණය - *ආචාර්ය මහේෂ් කේ. බණ්ඩාර*
නිෂ්පාදනය - *ඉන්ද්‍රාණි පෙරේරා, සාමප්‍රිය සුමනසේකර, ලලිත් අමරවීර, නාලිකා පද්ම-සේන, ජයසිරි ලියනපතිරණ, මහී මහානාම, කරෑ කටුවන්දෙනිය, වෛද්‍ය දයා අමරසේකර, නිශාන්ත ජයකොඩි සහ රාණි බණ්ඩාර*
ආලෝකකරණය සහ කැමරා අධ්‍යක්ෂණය - අයෙෂ්මන්ත හෙට්ටිආරච්චි
තිර රචනය - *කේ. බී. හෙරත්*
සංස්කරණය - *ඉසුරුසංජය තීනුදියෙස්*
සංගීත අධ්‍යක්ෂණය - *ඉන්ද්‍රජිත් මිරිහාන*
අංග රචනය - *වසන්ත විට්ටච්චි*
පසුබිම් සංගීතය පටිගත කිරීම - *දයානන්ද පෙරේරා, සුනන්ද මෙත්තසිංහ සහ අනුර රණසිංහ*
ගී පදමාලා - *බන්දුල නානායක්කාරවසම්*
ගායනය - *සුනිල් එදිරිසිංහ, ප්‍රදීපා ධර්මදාස, අනුරාධා නන්දසිරි*
සහාය අධ්‍යක්ෂණය - *මහින්ද ප්‍රසාද් මස්ඉඹුල*
ද්විතීය කැමරාකරණය - *මහේෂ් බණ්ඩාර*
තාක්ෂණික අධ්‍යක්ෂණය - *ටෙල්ස්ටාර් ටීවීයේ ප්‍රොඩක්ෂන්ස් ප්‍රයිවේට් ලිමිටඩ් වෙනුවෙන් බන්දුල වීරක්කොඩි*

හා නිසඟ කුසලතාවයන් ප්‍රදර්ශණය කිරීමට සමත්ව ඇති බව කිව යුතුය. මෙම වෘතාන්තයේ ප්‍රබන්ධකරුවාද මහේෂ්මය.

ආදරය, ප්‍රේමය, සෙනෙහස මේ කිනම් වචනයකින් පැවසුව ද, මිනිසාගේ පැවැත්ම ස්ථිර කරන්නට මෙම හුදු මානුෂීය ආවේදනයන් අත්‍යාවශ්‍ය වන්නේමය. මෙකී මානුෂීය ආවේදන වලට, සමාජීය සාදක වලින් වියුක්ත වූහු දෙකලා පැවැත්මක් නැති අතරම, මෙම හුදු ආවේදනයන්ට සීතැඟි අනුව කටයුතු කරන්නට සමාජීය සාදක ඉඩහසර ලබාදෙන අවස්ථා මෙන්ම එලෙස ඉඩහසර ලබා නොදෙන අවස්ථාද ඇත. සමා-ජයේ පවතින මෙවන් යථාර්ථයන් ඉතා සූක්ෂම ලෙස උකහාගෙන, ධනාත්මකවූ යම් පණිවිඩයක් සමාජය වෙත දියහැකි සාර්ථක නිර්මාණයක් බිහි කිරීම සැබවින්ම අභියෝගයක් වන්නේය. "මතක සුළඟ" ටෙලි වෘතාන්තය ගැන සලකා බැලූවිට, ආචාර්ය මහේෂ් බණ්ඩාරයන් එම අභියෝගය ජයගෙන ඇති බව පෙනේ.

පරම්පරා අතර සටිටනය මැනවින් ගවේෂණය කරන "මතක සුළඟ", ඕස්ට්‍රේලියානු සමාජ සංදර්භය තුළ, අප දරුවන් ශික්ෂණය කිරීමෙහි හා ඔවුන්හට අපගේ සාම්ප්‍රදායික වටිනාකම් ආරෝපණය කිරීමට බලපෑම් කිරීමේ අවදානම සහ දුෂ්කරතාවය කෙබඳු ද යන්න මෙම වෘතාන්තය තුළින් විචක්ෂණව විමසා ඇත.

නිර්මාණශීලී ප්‍රවීණ තිර රචකයෙකු වන කේ බී හේරත් ඔහුගේ නිසඟ කුසලතාවයන් සුපුරුදු ලෙසම නුවා දක්වමින් "මතක සුළඟ" ට ලබා දී ඇත්තේ මහඟු ආලෝකයකි. යොවුන් සංගීත අධ්‍යක්ෂකවරයෙකු වූ ඉන්ද්‍රජිත් මිරිහානගේ සංගීත අධ්‍යක්ෂණය ද මෙම වෘතාන්තයෙහි පුළුල් පරාසයක විහිදෙන අභිශයසංවේදී අවස්ථාවන් උද්දීපනය කිරීමට ඉතා අගනා මෙහෙයක් කර ඇත. ආලෝකකරණය සහ කැමරා අධ්‍යක්ෂක ලෙස අයෙෂ්මන්ත හෙට්ටිආරච්චි ටෙලි වෘතාන්තයේ විවිධ අවස්ථාවන්, චරිත උද්වේගයන් හා ඕස්ට්‍රේලියානු පරිසරය ඉතා ප්‍රශස්ථ ලෙස තම කාවය තුළින් ග්‍රහණයකර ගෙන තිබේ.

බන්දුල නානායක්කාරවසම් විසින් රචනා කරන ලදුව, සුනිල් එදිරිසිංහ, අනුරාධා නන්දසිරි සහ ප්‍රදීපා ධර්මදාස විසින් ගයුණු ගී "මතක සුළඟ" මනා ලෙස වර්ණවත් කිරීමට පිටි වහලක් වී ඇත.
ප්‍රවීණ රංගන ශිල්පීන් වන ශ්‍රියන්ත මෙන්ඩිස් ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර කොන්සල්වරයා ලෙසද, කුසුම් රේණු ඔහුගේ බිරිය ලෙසද ඔවුන්ගේ සුපුරුදු විශිෂ්ඨ රංගන කුසලතාවයන් දක්වමින් "මතක සුළඟ" ඔපවත්කර ඇත. ඔවුන්ගේ දියණිය ලෙස රඟන චතුරිකා පීරිස් ද තම නිසඟ කුෂලතාවයන් විදහා දක්-වමින් එම චරිතයට මනා සාධාරණත්වයක් ඉටුකර ඇති බව කිව මනාය.

දිගු කාලයක් තිස්සේ රංගනයෙන් ඉවත්වී, සංගීත කටයුතුවල නිරතවූ ලක්ෂ්මන් විජේසේකර එම නිහැඩියාව බිඳිමින්, තම භාව ප්‍රකාශන හැකියාවන් මනා ලෙස ඉදිරි පත් කරමින් "මතක සුළඟ" ට අති විශිෂ්ඨ මෙහෙයක් ඉටුකර ඇත.
මහින්දගේ චරිතයට පණ පොවන කාංචන කොඩිතුවක්කු ද ඉතාමත් දක්ෂ ලෙස රඟපාමින් මෙම ටෙලි වෘතාන්තයට ආලෝකයක් සපයන අතරම, ගීතා කාන්ති ජයකොඩි, සම්පත් කුමාරතුංග, චන්ද්‍රා කලුආරච්චි, වසන්ත විට්ටච්චි, විමලේන්ද්‍ර කුමාරි, චන්ද්‍රානි බුද්ධිපාල, ඉන්ද්‍රජිත් මිරිහාන, චම්පා බුද්ධිපාල, මනෝහාරි විමලතුංග, නිස්ස බණ්ඩාරනායක, මාධවී රවිප්‍රිය, දිනුකි ද සිල්වා, සුනිල් ද සිල්වා, මංජුල සේනානායකයනාදී වූ නළු නිළි කැල ඇතුළු සහාය නළු නිළි සැමගෙන් "මතක සුළඟ" ටෙලි වෘතාන්තයට ලැබී ඇත්තේ මහඟු දායකත්වයකි.

"මතක සුළඟ" ටෙලි වෘතාන්තය වර්ණවත් කර ගැනීමට සිනුවර වාසී කලාකරුවන්ගේ රංගන කුසලතාවන් ද එක්කර ගෙන තිබීම මෙහිදී සුවිශේෂී ලෙස දැක්විය යුතුව ඇත.
ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරින් නිෂ්පාදනය හා අධ්‍යක්ෂණයවූ "මතක සුළඟ" ශ්‍රී ලංකාවේ ටෙලි නාට්‍ය කලාවට මෙන්ම ලාංකීය ටෙලි ප්‍රේක්ෂකයින්ට නවමු අත් දැකීමක් එකතු කරනු ඇති බව නම් ඉඳුරා පැවසිය හැකිය.

ස. ම. සිසිරකාන්ත

ආසිරි වනිගරත්න

නිදන කාමරය තුළ ඇති කැඩපත් ගැටළු ඇතිකරයි

කැඩපත් වලට හොඳ හා නරක දෙකම කළහැකිය. කැඩපත් වලට විශාල ප්‍රමාණයක හානියක් කළහැකි එකම ස්ථානය වන්නේ නිදන කාමරයයි. නිදන කාමරය තුළ කැඩපත් තහනම් දෙයකි. මන්ද යුවළකගේ ආදර ජීවිතයට හෝ විවාහ ජීවිතයට කැඩපත් මහත් විනාශයක් සිදුකරන නිසා තවත් පැහැදිලි කළොත් දෙදෙනා අතරට තුන් වැන්නෙක් ඇතුළු වීමට නිදන කාමරය තුළ ඇති කැඩපත් වගකිව යුතුය. නමුත් ඔබට ඔබේ නිදන කාමරය තුළ කැඩපතක් තබාගත යුතුම නම් නිදාගන්නා අතරතුරේදී එම කැඩපත රෙද්දකින් වසා දමන්න. සිවිලිම මත කවදාවත් කැඩපත් සවික-රන්න එපා.

ඇඳට කෙලින්ම මුහුණලන කැඩපත් වලින් ඔබ විශේෂයෙන්ම ප්‍රවේශම් විය යුතුයි. කබඩ්වල කෙලින්ම ඇඳ දෙස බලා සිටින කැඩපත් සහිත දොරවල් තිබෙන විට මෙය සිදුවිය හැකියි. විවාහ ජීවිතය කඩාබිඳ දමන හා අනියම් සබඳතා, වරදෙහි බැඳීම් ආදියට හේතුව ඇඳ දෙසට හැරී තිබෙන කැඩපත් වල අහිතකර ශක්තිය බව ෆෙංෂුයි ප්‍රවීනයන් අවධාරණය කරයි. එමනිසා ඔබේ නිදන ඇඳ යම් කිසි කණ්නාඩියකින් පෙනෙනවානම් එම කණ්නාඩිය වහාම වෙනත් ස්ථානයකට ගෙනයන්න. කැඩපත ඇතිකරන අහිතකර ශක්තීන් එම ඇඳේ නිදන යුවළගේ සම්බන්ධය අවුල් කර දමන බව ෆෙංෂුයි වල පැහැදිලිවම සඳහන් වේ.

දිගු රාත්‍රී කාලය අතරතුරේදී අප රැඳී සිටින කාමරය වන්නේ නිදන කාමරයයි. එබැවින් මාව පිළිඹිබු කරන කැඩපත් තබා නොගන්නා මා තදින් සැළකිලිමත් වෙනවා.

SPIRITUALITY CLEANSING

ෆෙංෂුයි විශේෂඥ යැප් (Yap) මහතාද කැඩපත පිළිබඳව අනතුරු අඟවයි. අවදිවන විට කෙනෙකු තමාවම කැඩපතේ පිළිඹිබු වී තිබීම එකපාරටම දැකීමේ කම්පනය කොතරම් කරදරකාරී විය හැකිද කියනවා නම් ඒ පුද්ගලයා සඳහා අහිතකර ශක්තීන් ඇතිකරයි.

වරක් යැප් මහතා ඉබාගාතේ යන භූතයින් (Spirits) මගින් හොල්මන් කරන බවට විශ්වාස කෙරෑ ස්ථානයක කරන ලද 'භූතයින් ඉවත්කිරීමේ කාර්යයක්' පිළිබඳ විස්තර කළා. ඒ කාර්යයේදී භූතයින්ව කැඩපතක් තුළින් පිළිඹිබු කරන රකඩපතක් භාවිතා කිරීම අදාල කරගෙන ඇත. ඉන්පසුව දුෂ්ඨ ආත්ම (භූතයින්) මර්ධනය කිරීමට එම කැඩපතටම ආශිර්වාද කර ඇත. යැප් මහතා කී පරිදි එම කාර්යයේදී මෙම අංගය නිසියාකාරව සිදු නොකළොත් එම භූතයින් කැඩපත ඇතුලේ සිරවී සිටිනවාලු. මෙම අප්‍රසන්න කතාව ඇසූදා පටන් මම කැඩපත් ගැන වැඩිපුර ප්‍රවේශම් වීමි.